**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2022**

-----------------------------------------------------------

සෞඛ්‍ය **පද්ධති** වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 ඔක්තෝබර් 26 දිනැතිව ඇති කර ගත් අංක 3727 SRI (COL) දරන ණය ගිවිසුම සහ 2018 ඔක්තෝබර් 26 දිනැතිව ඇති කර ගත් අංක 0618 – SRI (SF) දරන **ප්‍රදාන** ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට සහ **ප්‍රදාන** ගිවිසුමට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව සහ ඌව යන පළාත් සභා හතර මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ගුණාත්මක අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා විශ්වීය ප්‍රවේශය සහ අඛණ්ඩ සත්කාර සැපයීමේ සංකල්පය මත පදනම්ව ප්‍රාථමික සෞඛය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ප්‍රතිචාර දැක්වීම මෙම ව්‍යාපෘතිය මගින් වඩිදියුණු කරනු ඇත. ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව අනුපිළිවෙලින් සහනදායී ණය වශයෙන් රු. මිලියන 5,813 ට සමාන එ.ජ.ඩො. මිලියන 37.5 ක් සහ රු. මිලියන 1,938 ට සමාන එ.ජ.ඩො. මිලියන 12.5 ක ප්‍රදානයකින් සමන්විත වන එකතුව රු. මිලියන 7,125 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් ලබා දිමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2018 **දෙසැම්බර්** 01 වන දින ආරම්භ කරන ලද අතර 2023 නොවැම්බර් 30 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරනලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම් කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ දී කමිටුව දෙවරක් පමණක් රැස් වී තිබුණි. | එම කාලය තුළ ඇති වූ දුෂ්කරතා හේතුවෙන් වසරේ සෑම කාර්තුවකටම මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | රෙගුලාසි වලට අනුකූල විය යුතු ය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| | අපේකෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | | |
| i. දිස්ත්‍රික් රෝහල් 04ක ගොඩනැගිලි ඉදිකිරීම. | 100 | 1 -ශුන්‍යයි<br>2-49 -70 | ඉදිකිරීම් සම්බන්ධව අපේක්ෂිත ප්‍රගතියක් ලබා නොතිබුණි. | ද්‍රව්‍ය ආනයන සීමා කිරීමත් සමඟ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම, ඉදිකිරීම් ද්‍රව්‍යවල පෙර නොවූ විරූ ලෙස මිල වැඩිවීම සහ එම කාලසීමාව තුළ ඒවා නොතිබීම හේතුවෙන් සිවිල් වැඩවලට බරපතල ලෙස බලපෑම් එල්ල විය. |
| ii. දිසා රෝහල 02ක ගොඩනැගිලි ඉදිකිරීම | 90 | ශුන්‍යයි | | |
| ii. ප්‍රාදේශිය සෞඛ්‍ය මධ්‍යස්ථාන 05ක ගොඩනැගිලි ඉදිකිරීම | 25 | ශුන්‍යයි | | |
| v. ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඒකකයක් ඉදිකිරීම | 23 | ශුන්‍යයි | | |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

ද්‍රව්‍ය ආනයන සීමා කිරීමත් සමඟ කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම, ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල පෙර නොවූ විරූ ලෙස වැඩිවීම සහ එම කාලසීමාව තුළ ඒවා නොතිබීම හේතුවෙන් සිවිල් වැඩවලට බරපතල ලෙස බලපෑම් එල්ල විය. සිවිල් වැඩ කොන්ත්‍රාත්තු සඳහා මිල වැඩි කිරීම ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටින සියලුම කොන්ත්‍රාත්කරුවන් කුඩා වැඩ කොන්ත්‍රාත්තු සඳහා මිල වැඩි කිරීමේ වගන්තිය ඇතුළත් කිරීමට ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගත යුතුය. මේ නිසා සිවිල් වැඩ කොන්ත්‍රාත්තුවල මන්දගාමී ප්‍රගතියක් ඇති වී තිබේ

**විගණකගේ නිර්දේශයන්**

අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| රු.මිලියන 109 ක් වටිනා කොන්ත්‍රාත් 09 ක ඉදිකිරීම් වැඩ අතර මඟ නවතා තිබූ අතර ඉන් කොන්ත්‍රාත්තු 06 ක් එක් කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. කාර්ය සාධන බැඳුම්කර මුදල් කර රු. 690,834ක් අය කර තිබුණ ද, ඊට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම, එක් කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් රු.මිලියන 3ක කාර්යසාධන බැඳුම්කරය අයකරගෙන නොතිබූ | ව්‍යාපෘතිය විසින් 2022 ජුනි 09 වන දින රු.690,834.10 (කොන්ත්‍රාත් වටිනාකමින් 10%) වටිනාකමට කාර්ය සාධන බැඳුම්කර රාජසන්තක කර ඇත. මධ්‍යම පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් නිකුත් කරන ලද බැංකු ප්‍රකාශයේ පිටපත සහ නිල ලදුපත විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. එක් කොන්ත්‍රාත්කරුවෙකුගේ රු.2,682,182 ක් වටිනා බැඳුම්කරය මුදල් කරන ලෙස අප බැංකුවෙන් ඉල්ලා සිටියද, කොන්ත්‍රාත්කරු අධිකරණයේ නඩුවක් පවරා ඇත. අප්‍රේල් 22 | නියමිත වේලාවට ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර රු.මිලියන 38 ක කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් නඩුවක් පවතින බැවින් මෙම කොන්ත්‍රාත් ගිවිසුම් අවසන් කිරීමට සහ කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | වැනිදා රු.1,578,000ක කාර්ය සාධන බැඳුම්කරයක් මුදල් කර ඇත. මෙම කොන්ත්‍රාත්තුවේ ඉතිරි වටිනාකම ලෙස රු.1,974,233 ක් ගෙවන ලෙස අපි දැනටමත් කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. තවත් එක් කොන්ත්‍රාත්තුවක් අවසන් කිරීමට ආසියා සංවර්ධන බැංකුවේ අනුමැතිය ඉල්ලා ඇත. | |

**3.3 මතභේදාත්මක ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලට අදාළව උපදේශන සේවා සැපයීම වෙනුවෙන් පොකුරු කළමනාකරණ විශේෂඥවරිය වෙත රු.751,894 ක මුදලක් ගෙවා තිබුණි. මෙම නිලධාරිනිය විසින් ව්‍යාපෘතියට ඉදිරිපත් කළ කලවැඩ වාර්තාවට අනුව ඇය එකම දවසේ සහ එකම වේලාවක එකිනෙකට වෙනස් ස්ථානවල සේවයේ නිරත වූයේ කෙසේද, යන්න විගණනයට අනාවරණය කර නොතිබුණි. | එම නිලධාරියා මෙම සංචාරයේදී හෙට්ටිපොළ, හඳුන්ගමුව, මාරක, ලග්ගල, හත්තොටඅමුණ සහ ඉලුක්කුඹුර යන රෝහල් ආවරණය කර ඇත. කෙසේ වෙතත්, එම නිලධාරියා දඹුල්ල පොකුරේ ප්‍රාදේශීය රෝහල් සඳහා තම වාර්තාවේ වෙන වෙනම සංචාරය කළ කාලය ලබා දී නොමැති අතර කලවැඩ වාර්තාවේ දක්වා ඇත්තේ දවසේ ආරම්භක වේලාව සහ අවසන් වේලාව පමණි. | ලබා දී ඇති තොරතුරු නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතුය. |
| (ආ) | 2019 ඔක්තෝබර් 11 සිට 2021 ඔක්තෝබර් 10 දක්වා කාලය සඳහා පමණක් පත් කරන ලද පරිසර විශේෂඥයෙකුට 2021 ඔක්තෝබර් 13 සිට 2021 දෙසැම්බර් දක්වා දිනකට රු.44,000 බැගින් රු.මිලියන 1.6 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | පරිසර විශේෂඥයාගේ කොන්ත්‍රාත්තුව අනුව 2019 ඔක්තෝබර් 11 සිට වසරක් සඳහා පත් කරන ලදී. මෙය වාර්ෂිකව දීර්ඝ කර ඇති අතර 2021 ඔක්තෝම්බර් මාසයේදී 2022 ඔක්තෝබර් 10 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, 2021 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා උපදේශක සමාලෝචන කමිටුවේ වාර්තාව අනුව 2021 ඔක්තෝබර් 10 දක්වා පමණක් දීර්ඝ කිරීම වැරදි ලෙස සටහන් කර තිබුණි. මෙය 2022 ඔක්තෝබර් 10 ලෙස නිවැරදි විය යුතු අතර කාලය දිර්ඝ කළ කොන්ත්‍රාත් ගිවිසුම උපදේශන ගොනුවේ තිබේ. | අනවසර ගනුදෙනු සඳහා ගෙවීම් නොකළ යුතුය. |